ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

<u>පුවත්පත් නිවේදනය</u>

## <u>ශ්‍රී ලංකා සහ ඉන්දීය හමුදා අතර ආරක්ෂක සහයෝගීතාවය පිළිබඳ අන්තර්ජාල සම්මන්ත්‍රණයක්</u>

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ කුසලතා වර්ධනය උදෙසා ධනාත්මක දායකත්වයක් ලබා දීමට ඉන්දියාව ගන්නා දැඩි කැපවීමේ කොටසක් ලෙස ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක අංශය විසින් 2021 ජනවාරි 13 වන දින අන්තර්ජාල සම්මන්ත්‍රණයක් සංවිධානය කර තිබිණ. ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති මෙම සම්මන්ත්‍රණයට ඉන්දීය සහ ශ්‍රී ලංකා හමුදා නිලධාරීන් සහ ඉන්දියාවේ ආරක්ෂක නිෂ්පාදන සමාගම්හි නියෝජිතයන් සහභාගී විය. මෙම අන්තර්ජාල සම්මන්ත්‍රණයේ මුලසුන හොබවන ලද්දේ නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් සහ ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී ඒ. ඩබ්. ඒ. පී. කේ. තිලකරත්න යන මහත්වරුන් විසිනි. ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් ආරක්ෂක අංශ සාමාජිකයන් රැසක් මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූහ. ශ්‍රී ලංකා ආරක්ෂක අංශයන්ගේ අභිලාෂයන් ළඟා කර ගැනීම සඳහා ඉන්දියාව විසින් දෙනු ලබන සහයෝගයන් සහ වේගයෙන් වර්ධනය වන ඉන්දීය ආරක්ෂක නිෂ්පාදන අංශය විසින් ලබා දිය හැකි අවස්ථාවන් පිළිබඳව නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස්තුමා මෙහිදී සඳහන් කළේය. අන්තර්ජාල සම්මන්ත්‍රණය අතරතුරදී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් උනන්දුවක් දක්වන නිෂ්පාදන ඉදිරිපත් කෙරිණ. කලාපය තුළ පොදු ආරක්ෂක තර්ජනයන්ට ඵලදායි ලෙස මුහුණ දීම හා කලාපයේ සැමට ආරක්ෂාව සහ සාමය (Security and Growth for All in the Region - SAGAR) යන ඉන්දියාවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් අතර සමීප සබඳතා ඉවහල් වනු ඇත.

***

කොළඹ
2021 ජනවාරි 16